# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2002 අංක 11 දරන මුදල් පනත

---

[සහතිකය සටහන් කළේ 2002 ජූලි මස 08 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2002 ජූලි මස 12 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 12.25 යි. තැපැල් ගාස්තුව : රු. 6.75 යි.

[සහතිකය සටහන් කළේ 2002 ජූලි මස 08 වන දින]

එල්.ඩී.-ඕ. 19/2002

**2002 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන මුදල් වර්ෂය සඳහා ඇතැම් මූල්‍යමය යෝජනා සහ වෙනත් කරුණුවලට නීත්‍යානුකූල බලයක් ලබාදීම සඳහා අවශ්‍ය නීතිමය විධිවිධාන පැනවීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 2002 අංක 11 දරන මුදල් පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

1 වන කොටස

**වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බද්ද පැනවීම**

**2.** 5 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, ශ්‍රී ලංකාවෙන් පිටත දී ආරම්භ වන ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන සෑම භාණ්ඩයක් මතම, ඒ භාණ්ඩයේ පිරිවැයෙන්, රක්ෂණ ගාස්තුවෙන් සහ නැව් ගාස්තුවලින්, සියයට එකක අනුප්‍රමාණයකට අනුව (මෙහි මින් මතු මේ කොටසෙහි "බද්ද" යනුවෙන් සඳහන් කරනු ලබන) වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බද්ද නම් වූ බද්දක් පනවා අයකර ගනු ලැබිය යුතු ය. — ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන භාණ්ඩ මත බද්ද.

**3.** ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන භාණ්ඩයක් මත 2 වන වගන්තිය යටතේ ගෙවිය යුතු බද්ද, ඒ භාණ්ඩය ආනයනය කරන තැනැත්තා විසින්, භාණ්ඩය ආනයනය කරනු ලබන අවස්ථාවේ දී, රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ගෙවනු ලැබිය යුතු අතර, එසේ බද්ද ගෙවීමේ දී රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බදු වශයෙන් අයකර ගනු ලැබූ මුදල සඳහන් කරමින් ඒ භාණ්ඩයට අදාළ ආනයන ඇනවුම් පත්‍රයේ පිටසනක් කිරීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය. — බද්ද, රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට ගෙවිය යුතු බව.

**4.** ශ්‍රී ලංකාවෙන් පිටත දී ආරම්භ වන, ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලැබූ— — ඇතැම් භාණ්ඩ මිල දී ගැනීම මේ පනතේ කාර්ය සඳහා ආනයනය කිරීමක් ලෙස සලකනු ලැබිය යුතු බව.

(අ) රේගු ආඥාපනත යටතේ ගෙවිය යුතු හෝ ගෙවනු ලැබිය යුතු යයි සලකනු ලැබිය යුතු වූ, යම් රේගු බද්දක්, අධිභාරයක් හෝ වෙනත් අය කිරීමක් අයකර ගැනීම සඳහා හෝ රේගු ආඥාපනතේ විධිවිධාන

2—H 15359—6,600 (2002/05)

උල්ලංඝනයක් සම්බන්ධයෙන් යම් භාණ්ඩයක් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විකුණනු ලැබූ අවස්ථාවක ; හෝ

(ආ) 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින්, ඒ පනත යටතේ යම් ගාස්තු අයකර ගැනීම සඳහා යම් භාණ්ඩයක් විකුණනු ලැබූ අවස්ථාවක ; හෝ

(ඇ) තමා විසින් පරිපාලනය කරනු ලබන බදු කිසිවක් වෙනුවෙන්, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් යම් භාණ්ඩයක් විකුණනු ලැබූ අවස්ථාවක,

ඒ භාණ්ඩය මිල දී ගනු ලබන තැනැත්තා, 3 වන වගන්තියේ කාර්යය සඳහා ඒ භාණ්ඩය ආනයනය කරනු ලබන තැනැත්තා ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව මේ පනතේ විධිවිධාන ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

නිදහස් කිරීම.

**5.** 1996 අංක 9 දරන තානාපති වරප්‍රසාද පනතේ විධිවිධාන යටතේ යම් රාජ්‍යයක දූත මණ්ඩලයක් විසින් හෝ යම් සංවිධානයක් විසින් යම් සේවාවක් සැලසීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන යම් භාණ්ඩයක් සම්බන්ධයෙන් 2 වන වගන්තියේ සඳහන් කිසිවක් අදාළ නොවිය යුතු ය.

බද්ද අයකර ගැනීම සඳහා රේගු ආඥාපනත අදාළ විය යුතු බව.

**6.** බද්ද අයකර ගැනීමේ කාර්යය සඳහා සහ මේ පනතේ පටහැනිව කුමක් සඳහන් වුවද එම බද්ද, රේගු ආඥාපනත යටතේ අයකර ගත යුතු රේගු බද්දක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ඒ බද්ද අයකර ගැනීම සම්බන්ධයෙන් රේගු ආඥාපනතේ විධිවිධාන අදාළ විය යුතු ය.

බදු වශයෙන් අයකර ගනු ලබන මුදල් ඒකාබද්ධ අරමුදලට බැරකරනු ලැබිය යුතු බව.

**7.** බදු මුදල් වශයෙන් මේ කොටස යටතේ රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අයකර ගනු ලබන සියලු මුදල්, ඔහු විසින් ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය.

**8.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ කොටසේ "භාණ්ඩය" යන්නෙන් යම් බඩු, ද්‍රව්‍ය යම් කෘෂිකාර්මික, උද්‍යාන විද්‍යාත්මක නිෂ්පාදනයන් හෝ වාණිජ භාණ්ඩ අදහස් වන නමුත් සකස් කොට නැවත අපනයනය කිරීමේ කාර්යය සඳහා ආනයනය කරනු ලබන දියමන්ති, මැණික්, රත්රන්, ස්වර්ණාභරණ සහ ඉලෙක්ට්‍රොනික භාණ්ඩ ඊට ඇතුළත් නොවේ.

9. සියලු කාර්ය සඳහා මේ පනතේ I වන කොටස 2002 මැයි මස 1 වන දින සිට බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය. අතීතයට බලපෑම.

10. 2002 මැයි මස 1 වන දිනයෙන් ආරම්භව මේ පනත ක්‍රියාත්මක වන දිනයෙන් අවසන් වන කාලය තුළ රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් භාණ්ඩයක් ආනයනය කරනු ලබන තැනැත්තකුගේ ඒ භාණ්ඩයේ පිරිවැයෙන්, රක්ෂණ ගාස්තුවෙන් සහ නැව් ගාස්තුවලින් සියයට එකකට සමාන මුදලක් අයකර ගනු ලබන අවස්ථාවක දී ඒ මුදල සියලු කාර්ය සඳහා නීත්‍යානුකූල ලෙස අයකර ගනු ලැබූ බවට සලකනු ලැබිය යුතු අතර එසේ අයකර ගැනීම සම්බන්ධයෙන් යම් සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු ලැබීමට එරෙහිව රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා මෙයින් වගකීමෙන් නිදහස් කරනු ලැබේ. වලංගුවීම.

## II වන කොටස

## 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම් සහ සූදු බදු පනත සංශෝධනය කිරීම

11. (මෙහි මේ කොටසේ "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම් සහ සූදු බදු පනතේ 3 වන වගන්තියෙහි "2 වන වගන්තියේ (ආ) ඡේදයේ සඳහන් යම් සූදු ව්‍යාපාරයක්" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් යම් ව්‍යාපාරයක්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. 1988 අංක 40 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය "මේ පනත යටතේ බද්ද ගෙවීමට යටත් තැනැත්තකු" යන වචන වෙනුවට "2002 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් වර්ෂයක් සඳහා මේ පනත යටතේ බද්ද ගෙවීමට යටත් තැනැත්තකු" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(1අ) 2002 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් වර්ෂයක් සඳහා මේ පනත යටතේ බද්ද ගෙවීමට යටත් තැනැත්තකු විසින් ඒ බද්ද පිළිවෙලින් ඒ වර්ෂයේ අප්‍රේල්, ජූලි, ඔක්තෝබර් සහ ජනවාරි යන මාසවල පළමුවන දින හෝ ඊට පෙර සමාන වාරික හතරකින් කොමසාරිස් ජනරාල්වරයා වෙත ගෙවනු ලැබිය යුතු ය. බද්ද ගෙවීමේ කාර්ය සඳහා බද්ද ගෙවීමට යටත් තැනැත්තා වෙත කොමසාරිස් ජනරාල්වරයා විසින් හඳුනාගැනීමේ අංකයක් නිකුත් කරනු ලැබිය හැකි ය :

එසේ වුවද, 2002 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු බද්ද ඔහු විසින් පිළිවෙලින් ඒ වර්ෂයේ ජූලි, ඔක්තෝබර් සහ ජනවාරි යන මාසවල පළමුවන දින හෝ එදිනට පෙර සමාන වාරික තුනකින් ගෙවනු ලැබිය යුතු ය :

එසේම තවදුරටත් 2 වන වගන්තියේ සඳහන් එවැනි යම් ව්‍යාපාරයක් පවත්වාගෙන යාම එවැනි යම් වර්ෂයක අප්‍රේල් මස 1 වන දිනයට පසුව ආරම්භ කරන තැනැත්තකු විසින් ඒ වර්ෂය සඳහා මේ පනත යටතේ ගෙවීමට යටත්ව සිටින බද්ද, වාරික හතරකට නොවැඩි වාරික ප්‍රමාණයකින් සහ මේ කරුණ පිළිබඳ සියලු අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගෙන සාධාරණ බවට කොමසාරිස් ජනරාල්වරයා විසින් සලකනු ලැබිය හැකි දිනවල දී ගෙවනු ලැබිය යුතු ය" ;

(3) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "(1) වන උපවගන්තියෙහි" යන වචන සහ ඉලක්කම් වෙනුවට "(1) වන හෝ (1අ) වන උපවගන්තිවල" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(4) ඒ වගන්තියේ අවසානයට පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන් :—

"(6) බද්දේ යම් වාරිකයක් ගෙවීම පැහැර හැර ඇති යම් අවස්ථාවක දී, පැහැර හැර ඇති වාරිකයේ විස්තර සහ පැහැර හැර ඇති තැනැත්තාගේ

නම ඇතුළත් සහතිකයක් කොමසාරිස් ජනරාල්වරයා විසින් පොලිස්පතිවරයා වෙත නිකුත් කළ යුතු අතර, ඒ සහතිකය පොලිස්පතිවරයා වෙත ලැබීමේ දී අවස්ථාවෝචිත පරිදි ඒ තැනැත්තා බුකී කරුවකුගේ ව්‍යාපාරය හෝ සූදු ව්‍යාපාරය සහතිකයේ සඳහන් කර ඇති ස්ථානයේ දී පවත්වා ගෙන යාම නතර කිරීම සඳහා පොලිස්පතිවරයා විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු ය."

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය සංශෝධනය කිරීම.

(1) ඒ උපලේඛනයේ (I) වන කොටසේ-

(අ) "2001 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන සෑම වර්ෂයක් ම සඳහා" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2001 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව එහෙත් 2002 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ම ආරම්භ වන වර්ෂය සඳහා" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ඒ කොටස අවසානයට පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන් :—

"2002 අප්‍රේල් මස
1 වන දින හෝ
එදිනට පසුව
ආරම්භ වන
සෑම වර්ෂයක් සඳහාම.
ව්‍යාපාරය පවත්වාගෙන
යාමේ දී සජීවී
රූපවාහිනී පහසුකම්
භාවිත කරනු
ලබන අවස්ථාවක දී ...... රුපියල් පන් ලක්ෂයයි

ව්‍යාපාරය පවත්වාගෙන
යාමේ දී සජීවී
රූපවාහිනී පහසුකම්
භාවිත නොකරන
අවස්ථාවක දී ...... රුපියල් දස දහසක්"; සහ

(2) ඒ උපලේඛනයේ II වන කොටසේ—

(අ) "2001 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන සෑම වර්ෂයක්ම සඳහා" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2001 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව එහෙත් 2002 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුවම ආරම්භ වන වර්ෂය සඳහා "; සහ

(ආ) ඒ කොටස අවසානයේ දී පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන් -

2002 අප්‍රේල් මස
1 වන දින හෝ
එදිනට පසුව
ආරම්භ වන සෑම
වර්ෂයක් සඳහා ම...... රුපියල් මිලියන දොළහයි."

අතීතයට බලපෑම.

**14.** මේ පනතේ II කොටස, සියලු කාර්ය සඳහා 2002 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

III වන කොටස

**2002 මැයි මස 1 වන දින සිට බලාත්මක වන පරිදි ඇතැම් මුද්දර බදු පැනවීම අහෝසි කිරීම.**

සාධන පත්‍ර සහ ලේඛන මත මුද්දර ගාස්තුව අහෝසි කිරීම.

**15.** මේ කොටසේ විධිවිධාන බලාත්මක වන දිනයේ හෝ එදිනට පසුව ලියා අත්සන් කරනු ලබන යම් සාධන පත්‍රයක මත හෝ ඉදිරිපත් කරනු ලබන හෝ ගොනු කරනු ලබන යම් ලේඛනයක් මත හෝ (මෙහි මින් මතු මේ කොටසෙහි "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1982 අංක 43 දරන මුද්දර ගාස්තු පනත යටතේ කිසිම මුද්දර ගාස්තුවක් පැනවීම හෝ ගෙවීම සිදු නොකළ යුතු ය.

අතීතයට බලපෑම.

**16.** මේ පනතේ III වන කොටස, සියලු කාර්ය සඳහා 2002 මැයි මස 1 වන දින සිට බලාත්මක වන ලෙස සලකනු ලැබිය යුතු ය.

ආපසු අයකර ගැනීම.

**17.** ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ මුද්දර ගාස්තු ගෙවීමට යටත් යම් තැනැත්තකු මේ පනත ක්‍රියාත්මක වීමේ දිනයට පෙර ලියා අත්සන් කරන ලද යම් සාධන පත්‍රයක් සම්බන්ධයෙන් හෝ ඉදිරිපත් කරන ලද හෝ ගොනු කරන ලද යම් ලේඛනයක

සම්බන්ධයෙන් 2002 මැයි මස 1 වන දින හෝ එදිනට පසුව කොමසාරිස් ජනරාල්වරයාට මුද්දර ගාස්තු ගෙවන අවස්ථාවක දී, කත් කාර්ය සඳහා කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමක් මත මුද්දර ගාස්තු වශයෙන් එසේ ගෙවන ලද මුදල ආපසු අයකර ගැනීමට ඒ තැනැත්තාට හිමිකමක් ඇත්තේ ය.

**18.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වන උපලේඛනයෙහි I වන ලැයිස්තුවේ සඳහන් යම් සාධන පත්‍රයක් මත හෝ ලේඛනයක් මත යම් මුද්දර ගාස්තුවක් පැනවීමට සහ අයකර ගැනීමට යම් පළාත් සභාවකට ඇති බලතලවල අගය අඩු කිරීමක් මේ කොටසේ විධිවිධාන මගින් සිදු නොකරන බව, සැක දුරුකිරීම සඳහා මෙයින් ප්‍රකාශ කරනු ලැබේ. සැක දුරු කිරීම.

IV වන කොටස

**1963 අංක II දරන මුදල් පනත සංශෝධනය කිරීම.**

**19.** 1963 අංක 11 දරන මුදල් පනතේ VI කොටස මෙයින් ඉවත් කරනු ලැබේ. 1963 අංක 11 දරන පනතේ VI වන කොටස ඉවත් කිරීම.

**20.** මේ පනතේ IV කොටස, සියලු කාර්ය සඳහා 2002 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වන ලෙස සලකනු ලැබිය යුතු ය. අතීතයට බලපෑම.

V වන කොටස

**1991 අංක 52 දරන ජාතික ආරක්ෂක බදු පනත සංශෝධනය කිරීම.**

**21.** 2001 අංක 4 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත (මේ කොටසෙහි "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1991 අංක 52 දරන ජාතික ආරක්ෂක බදු පනතේ 3 වන වගන්තියේ (2) උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ. 1991 අංක 52 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ උපවගන්තියේ අ. අයිතමයේ (ඒ) ඡේදයේ (xi ඇ) අනුඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් :-

"(xi ඇ) බැංකුවක් මාර්ගයෙන් විදේශ ව්‍යවහාර මුදලින් ගෙවීම් ලැබෙන ශ්‍රී ලංකාවෙන් පිටත හඳුනාගත් එක් සේවාපේක්ෂකයකුට හෝ සේවාපේක්ෂකයන් වැඩි සංඛ්‍යාවකට 2001 අප්‍රේල් මස 01 වන දින දී හෝ එදිනට පසුව අන්තර් ජාලය හෝ දුරකථනය ඔස්සේ අනන්‍යව සේවාදායක ආධාරක සේවා සැපයීම පිණිස පිහිටුවන ලද ව්‍යවසායක් මගින් අන්තර් ජාලය හෝ දුරකථන ඔස්සේ සපයන සේවාපේක්ෂක ආධාරක සේවාවලින් ;";

(2) ඒ උපවගන්තියේ (ඕ) වන ඡේදයෙහි "ගුවන් යානා ඉන්ධනවල වටිනාකම.", යන වචන වෙනුවට "ගුවන් යානා ඉන්ධනවල වටිනාකම;" යන වචන ආදේශ කිරීමෙන්,

(3) ඒ උපවගන්තියේ අවසානයට පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් :—

(ක) ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද රෙදිවලින් අපනයනය කිරීම සඳහා යම් තැනැත්තකු විසින් නිෂ්පාදනය කරනු ලබන ඇඟලුම් වලින් දේශීය වශයෙන් විකිණීම සඳහා අවසර දෙනු ලබන යම් ඇඟලුම් ප්‍රතිශතයක් විකිණීමේ දී ඒ එක් එක් ඇඟලුම සඳහා රුපියල් විසි පහක මුදලක් ගෙවනු ලැබ ඇති අවස්ථාවක ඉන් ලැබෙන මුදල ; සහ

අතීතයට බලපෑම.

**22.** මේ පනතේ V වන කොටස, සියලු කාර්ය සඳහා 2002 අප්‍රේල් මස 1 දින සිට බලාත්මක වන ලෙස සලකනු ලැබිය යුතු ය.

## VI වන කොටස

### 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනත සංශෝධනය කිරීම.

1996 අංක 34 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

**23.** (1) 2000 අංක 26 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත (මේ කොටසෙහි මෙහි මින් මතු) "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1996 අංක 34 දරන භාණ්ඩ හා

සේවා බදු පනතේ 2 වන වගන්තියේ (3) වන උපවගන්තියෙහි "භාණ්ඩ ආනයනය මත වූ බද්ද" යන වචනවල සිට "එසේ වුවද භාණ්ඩ නිෂ්පාදනය කිරීම" යන වචන දක්වා වූ සියලුම වචන ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ. :—

"(3) භාණ්ඩ ආනයනය මත වූ බද්ද, එය තීරු බද්දක් වූවාක් මෙන් ද ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන සියලු භාණ්ඩ බද්දට හා තීරු බද්දට යටත් වූවාක් මෙන් ද පනවා අයකර ගත යුතු ය.

එසේ වුවද –

(අ) රේගු බන්ධිත ප්‍රදේශයට ඇතුළු කරන ලද යම් භාණ්ඩ මත ; හෝ

(ආ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ අපනයනය කිරීම සඳහා ඇඟලුම් නිෂ්පාදනය කිරීමට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුමකට ඇතුළත් වී ඇති යම් තැනැත්තකු විසින් අපනයනය කිරීම සඳහා ඇඟලුම් නිෂ්පාදනය කිරීමේ කාර්ය සඳහා එම තැනැත්තකු විසින් අපනයනය කරනු ලබන රෙදිවලට සහ අපනයනය කිරීම සඳහා ඇඟලුම් නිෂ්පාදනය කිරීමේ කාර්යය සඳහා රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ හෝ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අනුමැතිය ඇතිව එකතු කල වටිනාකමක් සහිතව හෝ රහිතව එම රෙදි තැනැත්තකුට යවනු ලබන අවස්ථාවක දී එම රෙදිවලට ;

(ඇ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ වෙනත් ඇඟලුම් නිෂ්පාදකයන් මාර්ගයෙන් ඇඟලුම් නිෂ්පාදනය කොට අපනයනය කිරීමේ කාර්ය සඳහා වෙළෙඳ මධ්‍යස්ථානයක් ලෙස ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි වී ඇති යම් තැනැත්තකු විසින් ආනයනය කරනු ලැබුවා වූ ද, අපනයනය කිරීම සඳහා ඇඟලුම් නිෂ්පාදනය කිරීමේ කාර්ය සඳහා රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ හෝ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අනුමැතිය ඇතිව එම නිෂ්පාදකයන් වෙත යවනු ලැබුවා වූ ද රෙදි ;

(ඇ) රෙදි නිෂ්පාදනය කිරීමේ කාර්ය සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමකට එළඹ ඇති යම් රෙදි නිෂ්පාදකයකු විසින් ආනයනය කරනු ලැබුවා වූ ද, රෙදි නිෂ්පාදනය කිරීම සඳහා භාවිත කරනු ලබන කෙඳි වර්ග, නූල්, අමු රෙදි, නිම කරන ලද රෙදි, රසායන ද්‍රව්‍ය සහ ඩයි වර්ග,

කිසිම බද්දක් අය කරනු නොලැබිය යුතු ය.

එසේම තවදුරටත් භාණ්ඩ නිෂ්පාදනය කිරීම.".

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියෙහි දෙවන අතුරු විධානයෙහි–

(අ) 22 වන වගන්තියේ (6) වන උපවගන්තියේ සඳහන් වෙනත් යම් තැනැත්තකු විසින් ආනයනය කිරීම මත අයවිය යුතු බද්ද ගෙවීම," යන වචන වෙනුවට "22 වන වගන්තියේ (6) වන උපවගන්තියේ සඳහන් වෙනත් යම් තැනැත්තකු විසින් ආනයනය කිරීම මත හෝ රෙදි නිෂ්පාදනය කිරීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමකට එළඹ ඇති තැනැත්තකු විසින් නිෂ්පාදනය කරන ලද රෙදි, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ ඇඟලුම් නිෂ්පාදනය කිරීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමකට එළඹ ඇති වෙනත් තැනැත්තකු විසින් මිල දී ගෙන අපනයනය කිරීම සඳහා ඇඟලුම් නිෂ්පාදනය කිරීම සඳහා භාවිත කරනු ලබන අවස්ථාවකදී එම රෙදි මත හෝ අයවිය යුතු බද්ද ගෙවීම" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) "ආනයනය කිරීමේ දින සිට" යන වචන වෙනුවට "ආනයනය කිරීමේ හෝ මිල දී ගැනීමේ දින සිට" යන වචන ආදේශ කිරීමෙන්,

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

**24.** 2001 අංක 5 දරන පනත මගින් අවසන්වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තියෙහි (ඇ) ඡේදයේ (ii) අනු ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අනු ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

"(ii) බැංකුවක මාර්ගයෙන් විදේශ ව්‍යවහාර මුදලින් ගෙවීම් ලැබෙන ශ්‍රී ලංකාවෙන් පිටත හඳුනාගත් එක් සේවාපේක්ෂකයකුට හෝ සේවාපේක්ෂකයන් වැඩි සංඛ්‍යාවකට

2001 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව අන්තර්ජාලය හෝ දුරකථනය ඔස්සේ අනන්‍යව සේවාදායක/ආධාරක සේවා සැපයීම පිණිස පිහිටුවන ලද ව්‍යවසායක් මගින් අන්තර්ජාලය හෝ දුරකථන ඔස්සේ සපයන සේවාපේක්ෂක ආධාරක සේවා,".

**25.** 2000 අංක 26 දරන පනතින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය පහත දැක්වෙන පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "බදු ගෙවීම කළ යුතුය" යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"බදු ගෙවීම කළ යුතු ය :

එසේ වුවද, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ අපනයනය කිරීම සඳහා යම් ඇහලුම් නිෂ්පාදකයකු සමග එළඹ ඇති යම් ගිවිසුමක් යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් දේශීය වශයෙන් විකිණීම සඳහා අවසර දී ඇති ඇහලුම් ප්‍රතිශතය ඇතුළත යම් ඇහලුම් සැපයීම මත අයවිය යුතු බදු මුදල ශ්‍රී ලංකාව ඇතුළත සපයනු ලබන එවැනි එක් එක් ඇහලුමක් සඳහා රුපියල් විසිපහක් විය යුතු ය." ;

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ අතුරු විධානයේ (ඇ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ඇ) යම් බදු අය කළ හැකි කාලසීමාවක් තුළ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුමකට ඇතුළත් වී සිටින ලියාපදිංචි තැනැත්තකු සම්බන්ධයෙන් වන විට සහ ඒ බදු අය කළ හැකි කාලසීමාව උපලේඛනයේ (xxvii) විෂයයේ සඳහන් වන යම් කාලසීමාවක් තුළ හෝ උපලේඛනයේ (xxviii) විෂයයේ සඳහන් යම් ගිවිසුමක සඳහන් කර ඇති පරිදි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාලසීමාව තුළ හෝ වාණිජ

ක්‍රියාකාරකම් ආරම්භ කිරීමෙන් සිදුවන්නේ කවර බදු අය කළ හැකි කාලසීමාවක දී ද ඒ කාලසීමාවලින් කලින් සිදුවන කාලසීමාව තුළට වැටෙන යෙදවුම් බද්දෙන් අතිරික්තයක් වේ නම්, ඒ අතිරික්තය ; හෝ

(3) ඒ වගන්තියේ (6) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(6අ) (3) වන උපවගන්තියේ සහ (5) වන උපවගන්තියේ (ii) ඡේදයෙහි සහ මේ පනතේ උපලේඛනයේ (xxvi) විෂයයේ කුමක් සඳහන් වුවද, 1969 අංක 17 දරණ ලංකා විදුලිබල මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද ලංකා විදුලි බල මණ්ඩලයෙන්, විදුලි බලය, සැපයුම්කරු විසින් විදුලි බලය මිල දී ගන්නා අවස්ථාවක දී, විදුලි බලය බෙදා හැරීමේ ව්‍යාපාරයේ නියැලී සිටින ලියාපදිංචි තැනැත්තකු සම්බන්ධයෙන් යෙදවුම් බද්ද සඳහා බැර වාසි ලබා දිය යුතු ය;

ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය සංශෝධනය කිරීම.

**26.** 2001 අංක 5 දරන පනත මගින් අවසන්වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනයේ (xxviii) විෂයාංකයෙහි (අ) ඡේදයෙහි (ii) අනු ඡේදය වෙනුවට පහත දැක්වෙන අනු ඡේදය ආදේශ කිරීමෙන් ඒ උපලේඛනය තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(ii) ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමෙන් පසු, බද්දෙන් නිදහස් සැපයුම් පමණක් සිදු කරන යම් තැනැත්තකු සම්බන්ධයෙන් වන විට නියමිත දිනයේ සිට 2002 ජුනි මස 30 වන දින හෝ එදිනට පෙර ............ කාලයක් තුළ ; හෝ"

අතීතයට බලපෑම.

**27.** (1) ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තියට–

(අ) මේ පනතේ 25(1) වගන්තිය මගින් කරන ලද සංශෝධනය 2001 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය ;

(ආ) මේ පනතේ 25(2) වගන්තිය මගින් කරන ලද සංශෝධනය 1998 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

(2) මේ පනතේ 23 සහ 26 වන වගන්ති මගින් පිළිවෙලින් ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියට සහ උපලේඛනයට කරන ලද සංශෝධන සියලු කාර්ය සඳහා 2002 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

**28.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.